**ජාතික විද්‍යා පදනම - 2019**
**-------------------------------**

## 1.1 මතය

**------**

ජාතික විද්‍යා පදනමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

පදනමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

**-----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ගෙවිය යුතු මුදල්

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 හා 2018 වර්ෂයන්හි සිට පැවතෙන රු. 5,520,068 ක් වූ ගෙවිය යුතු ශේෂයන් සහ වසර කිහිපයක සිට පැවත එන රු.134,249 ක් වූ හඳුනානොගත් තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2017 හා 2018 වර්ෂයන්හී සිට පැවතෙන රු.5,520,068 ක් වූ ශේෂයන්ගෙන් රු. 1,840,575 ක් වූ විගණන ගාස්තු හා රු.1,370,402 ක් වූ ගොඩනැගිලි නඩත්තු වියදම් වාර්ෂික ප්‍රතිපාදන ලැබීමෙන් පසු නිරවුල් කිරීමටත්, රු. 6001 ක් වූ ගොඩනැගිලි වියදම කළමනාකරන මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන පොත්වලින් ලියාහැරීමටත් ඒකාබද්ධ මාදුකාංග වැඩසටහන සඳහා ගිවිසුම් ප්‍රකාරව ගෙවීමට ඇති රු. 1,803,090 ක ශේෂය නිති උපදෙස් ප්‍රකාරව කළමනාකරන මණ්ඩලයේ අනුමැතිය ඇතිව දෙපාර්ශවයේ එකඟතාවය මත ගිවිසුම අවලංගු කිරිමෙන් පසු ඉවත් කිරිමටත් කටයුතු කරනු ලැබේ.<br>හඳුනා නොගත් තැන්පතු ලෙස දක්වා ඇති රු. 124,249 ක මුදල විවිධ ආදායම් ලෙස හඳුනා ගිණුම් ගත කිරීමට ක්‍රියා කරනු ඇත. | ශේෂ නිරවුල් කිරීමට සුදුසු ක්‍රියා මාර්ග ගත යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 8/97 | අතිකාල දීමනා ගෙවීම මසකට පැය 20 ක උපරිමයකට සීමා කළ යුතු අතර විශේෂ හේතූන් මත උපරිම සීමාව ඉක්මවීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ මත අදාල අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව 2019 ජනවාරි 01 දින සිට 2019ජූනි 30 දක්වා අතිකාල දීමනා ලෙස රු.1,125,717 ක් ගෙවා තිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 8/97 ප්‍රකාරව අතිකාල දීමනා ගෙවීම මසකට පැය 20ක උපරිමයකට සීමා කල යුතු වුවද, මෙම සීමාව ඉක්මවා සිදුකරන ලද අතිකාල සඳහා අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොමැත. භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත්කර ඇති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 40 (PED 40) අනුව, රා:ප: චක්‍රලේඛ රාජ්‍ය ව්‍යාපාර ආමන්ත්‍රණය කර නිකුත්කර ඇත්නම් පමණක් එහි විධිවිධාන ආදේශ කර ගන්නා අතර ඉහත 8/97 රා:ප: චක්‍රලේඛයෙන් අර්ධ රාජ්‍ය ආයතන ආමන්ත්‍රණය කර නොමැති බැවින් එහි විධිවිධාන අප ආයතනය අදාල කරගෙන නොමැත. | රාජ්‍ය ව්‍යාපාර සඳහා PED 40 චක්‍රලේඛයේ අතිකාල ගෙවීම් සම්බන්ධ සටහනක් නැත. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.26,874,083 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.31,393,021 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.58,267,104 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.33,500,000 ක් හා වෙනත් ලැබීම් රු.11,500,000 කින් වැඩිවීමද, ප්‍රාග්ධන වියදම් රු.30,000,000 කින් අඩුවීමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ මිළදී ගත් වසරක පමණක් වලංගු කාලයක් ඇති OFFICE 365 මෘදුකාංගයේ රු.5,786,158 ක් වූ වටිනාකම, අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ද රු.5,789,249 ක් වියදම් කර එම මෘදුකාංගයේ බලපත්‍රය අළුත් කරගෙන තිබුණු අතර එම වියදම සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ හා සංවර්ධන වියදමක් ලෙස ආදායම් හා වියදම් ගිණුමට ගිණුම් ගත කර තිබුණි. මෙවැනි මෘදුකාංගයක අවශ්‍යතාවය කුමක්ද යන්න පිළිබඳව විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය. | මෙය Word, Excel, PowerPoint, Outlook, ගොනු ගබඩා කිරීමේ සේවාව සහ සහයෝගී වේදිකා (collaborative platforms) වැනි සාමාන්‍ය කාර්යාලීය ඵලදායිතා යෙදුම් වලින් සමන්විත මෘදුකාංග කට්ටලයකි.<br>කෙසේ වෙතත්, සැලකිය යුතු වියදමක් වාර්ෂිකව දැරීමට සිදුවීම හේතුවෙන්,පවත්නා බලපත්‍ර ප්‍රමාණය සීමා කිරීමට හෝ පිරිවැය කළමණාකරනය කරන ලාභදායී විසඳුමකට සංක්‍රමණය වීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත. | පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේ අරමුණු වෙනුවෙන්ම එම ප්‍රතිපාදන යෙදවිය යුතුය.<br>එමෙන්ම මෙම මෘදුකාංගයෙන් උපරිම ඵලදාවක් ලබා ගැනීමට හෝ අඩු වියදම් සහිත පැකේජයක් මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පොත්, සඟරා, ප්‍රකාශන, ජ(ර්)නල් අවශ්‍ය පුද්ගලයන්ට විකිණීම ජාතික විද්‍යා පදනම මගින් සිදු කරනු ලැබුවද ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා සාර්ථක ක්‍රමවේදයන් අනුගමනය කර අලෙවි ආදායම වැඩිකර ගැනීමටද ආයතනය කටයුතු කර නොමැති බැව් නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් එකතු වටිනාකම රු. 2,916,470 ක් වූ ප්‍රකාශන 10265 ක්ද, මිල සඳහන් නොවන ප්‍රකාශන 5833 ක්ද, තොග ඉතිරි වී පවතින බව නිරීක්ෂණය විය. | එන්එස්එෆ් ප්‍රඥප්තිය අනුව විද්‍යාව ජනප්‍රිය කිරීම ක්‍රම කිහිපයකින් සිදු කෙරේ. විද්‍යාත්මක දැනුම වැඩි දියුණු කිරීමට කැමති පුද්ගලයින්ට ප්‍රකාශන විකිණීම එකකි. ඒ අනුව ප්‍රකාශනවලින් ආදායම් උත්පාදනය අපේක්ෂා කළ නොහැකිය. කෙසේ වෙතත්, ප්‍රකාශන එන්එස්එෆ් වෙබ් අඩවියට උඩුගත කරනු ලැබේ. ඒ හැරුණු විට, අන්තර්ජාලය හරහා විද්‍යා පොත් සෙවීම සඳහා එන්එස්එෆ් ප්‍රකාශන ලැයිස්තුව වෙබ් අඩවියට උඩුගත කිරීමට පියවර ගනු ඇත. මීට අමතරව, | අලෙවි ප්‍රවර්ධනයට සුදුසු ක්‍රමවේදයක් හෝ අලෙවි වන ප්‍රමාණය හෝ බෙදාහැරීමට ඇති ප්‍රමාඛය මත මුද්‍රණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | එන්එස්එෆ් විසින් සංවිධානය කරන ලද උත්සව වලදී සහ බාහිර ආයතන විසින් සංවිධානය කරනු ලබන වෙනත් සංසදවලදී එන්එස්එෆ් ප්‍රකාශන සඳහා ප්‍රචාරය ලබා දෙනු ඇත. | |
| (ආ) | ආයතනයේ රියදුරන්ගේ රාජකාරි වේලාවන් පරීක්ෂා කිරීමේ දී ඇතැම් රියදුරන් දිනපතා පැය 21 කට ආසන්න කාලයක් රාජකාරියේ නිරත ව සිටින අවස්ථා නිරීක්ෂණය විය. මෙය සේවකයන්ගේ සෞඛ්‍ය ගැටළු ඇති වීම කෙරෙහි සෘජුවම බල පෑ හැකිය. එමෙන්ම, මගීන්ගේ ආරක්ෂාව රියදුරෙකුගේ ප්‍රමුඛතම වගකීමක් වන අතර පැය 21 කට ආසන්න කාලයක් රියදුරු රාජකාරියේ නිරතව සිටින අයෙකුගෙන් මගී ආරක්ෂාව තහවුරු කළ හැකිද යන්න ගැටළු සහගත වේ. | මෙම තත්වය නිරීක්ෂණය කර අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ උපදෙස් පරිදි රියදුරන්ගේ රාජකාරියේ නිරතවන වැඩකරන කාල සීමාව සැප්තැම්බර් මස 01 දින සිට සංශෝධනය කර ඇත.<br>එහෙත් අතිකාල දීමනා ගෙවීම් PE guidelines for good governance අනුව මාසික අතිකාල ගෙවීම් කළමණාකරණ මණ්ඩලයට වාර්තා කිරීමට ක්‍රියා කරනු ඇත. | රියදුරන්ගේ දිනක සේවා කාලය ප්‍රායෝගිකව වැඩ කළ හැකි සේවා කාලයක් විය යුතුය. |
| (ඇ) | 2019 ජූලි 17 දින අංක 0002323270 දරණ ජංගම ගිණුමේ චෙක් පිලිපත් පරීක්ෂා කිරීමේ දී අනුක්‍රමිත අංක අනුපිළිවෙලට චෙක්පත් නිකුත් කිරීම් සිදු නොවන බවත් අක්‍රමවත් අයුරින් චෙක්පත් නිකුත් කර තිබූ බවත්, චෙක්පත් අංක 444852 සිට 444862 දක්වා චෙක්පත් හිස්ව තබා 2019 ජනවාරි මාසය සඳහා චෙක්පත් ලිවීම ආරම්භ කර ඇති බවත් නිරීක්ෂණය විය. | 2018 වසරේ ලියා ඉතිරිව තිබූ චෙක්පත් කිහිපයක් 2019 ජනවාරි මාසයේ දී නිකුත් කර ඇති අතර, පෙන්වා දී ඇති කරුණු සැලකිල්ලට ගෙන චෙක්පත් අනුක්‍රමික අංක පිළිවෙලට නිකුත් කිරීමට සටහන් කර ගන්නා ලදී. එසේම ඉදිරියේදී නිවැරදිව චෙක්පත් අනුක්‍රමික අංක පිළිවෙලට නිකුත් කිරීමට අවශ්‍ය උපදෙස් ලිඛිතව ලබා දී ඇත. | චෙක්පත් නිවැරදිව අනුක්‍රමික අංක පිළිවෙලට නිකුත් කිරීම කළ යුතුවේ. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපකරණ ප්‍රදාන ලබා දීමේ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රදානයන් ලබා දී මාස 06 ක් ඇතුළත උපකරණ මිලදී ගත යුතු වුවත් 2017/18 වෙනුවෙන් ලබාදුන් රු. 5,353,815 ක් වටිනා උපකරණ ප්‍රදාන 06 න් රු.2,429,840 ක් වටිනා උපකරණ 03 ක් 2019 | මිලදී ගැනීමේ ප්‍රමාදයක් පවතින අතර ප්‍රමාදය පිළිබඳ නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි වේ. අරමුදල් 2018 නොවැම්බර් සහ 2018 දෙසැම්බර් මාසවලදී නිකුත් කරන ලදී. එබැවින් මාස හය පිළිවෙලින් 2019 මැයි සහ 2019 ජුනි මාසවලදී අවසන් වේ. කෙසේ වෙතත්, 2019 අප්‍රේල් මාසයේ සිදු වූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් උපකරණ මිලදී ගැනීමේ | උපකරණ ප්‍රදාන ලබා දීමේ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඔක්තෝබර් 30 පිළිතුරු ලද දිනය වන විටත් මිලදී ගෙන නොතිබුණි. | ක්‍රියාවලිය ප්‍රමාද කරමින් මාස දෙකකට ආසන්න කාලයක් විශ්ව විද්‍යාල වසා දමන ලදී.<br>කෙසේ වෙතත්, උපකරණ මිලදී ගැනීම මතක් කරමින් දීමනාපත්‍ර කරුවන්ට නිරන්තර මතක් කිරීම් යවන ලදි. මේ වන විට උපකරණ 03 ක් විශ්ව විද්‍යාල වෙත පැමිණ තිබේ. | |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපකරණ ප්‍රදාන යටතේ පර්යේෂණයක් සඳහා උපකරණ ලබා ගැනීමේ අරමුණ වනුයේ තමා විසින් සිදුකරනු ලබන පර්යේෂණයන් සඳහා ප්‍රයෝජනයට ගැනීම වුවත් 2017/2018 වර්ෂයේ ප්‍රදානයන් 06කට අදාලව ප්‍රදානයන් ඉල්ලුම් කරන දිනය හා ප්‍රදානයන් ලබාදෙන දිනයන් අතර අවුරුදු 01 ත්, අවුරුදු 03ත් අතර ප්‍රමාදවීමක් නිරීක්ෂණය විය. ප්‍රදානයන් ලබාදුන් පසුවද උපකරණ මිලදී ගැනීමට වැඩි කාලයක් ගතවී තිබුණි. | උපකරණ ප්‍රදාන ප්‍රදානය කරනු ලබන්නේ තනි ව්‍යාපෘතියක් හෝ තනි භාවිතය සඳහා පමණක් නොව, උපාධි හා පශ්චාත් උපාධි ව්‍යාපෘති සඳහා එය බහුලව භාවිතා කළ හැකිය. බොහෝ පර්යේෂණ ව්‍යාපෘති වසර 3-5ක් අඛණ්ඩව සිදුවන බැවින් අධ්‍යයනයේ අවසාන භාගයේදී එම ව්‍යාපෘති සඳහා උපකරණ ප්‍රයෝජනවත් විය හැකිය. 2017 දී ප්‍රදානය කරන ලද ඉහත ප්‍රදාන සඳහා අරමුදල් මාරු කිරීමේ ප්‍රමාදයක් ඇති වූ අතර, උපකරණ ප්‍රදානවල අරමුදල් අවශ්‍යතාව සපුරාලීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ලැබුණු ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවීය. එනිසා උපකරණ මිල ඉහළ ගොස් තිබේ නම් අතිරේක අරමුදල් දරා ගැනීමට එකඟ විය. | ප්‍රමාදයකින් තොරව අරමුදල් ලබාදීමට කටයුතු කිරීම හා උපකරණ ප්‍රදාන ගිවිසුමේ ප්‍රකාරව නියමිත කාලය තුළ මිලදී ගැනීම් සිදුකළ යුතු බව |